


# දර්ශනය

## ඉතිහාසය ගවේෂණය, තොරතුරු සංරක්ෂණය හා දැනුම ලබාදීම උදෙසා වන රාජධානි ජාලයේ ප්‍රජා මූලික වැඩසටහන

# පරමාර්ථය

ඉතිහාසය පිළිබද තොරතුරු ගවේෂණය, සංරක්ෂණය හා සමාජගත කිරීම



# අරමුණු

- උරුම ස්ථාන හඳුනාගැනීම
- ස්ථාන සිතියම්ගත කිරීම
- ඡායාරූප හා වීඩියෝ ලේඛනගත කිරීම
- ජනශ්‍රැති අධ්‍යයනය හා විශ්ලේෂණය
- පර්යේෂණ දිරිගැන්වීම
- ප්‍රජාව දැනුවත් කිරීම
- සංරක්ෂණ ව්‍යාපෘති සඳහා ජනතා සහභාගීත්වය ගොඩනැගීම
- රාජධානි ජාලය හරහා උරුම දත්ත ගබඩාවක් නිර්මාණය කිරීම

# අගසෙති නායක

අගසෙති වායාම දර්ශනය හා පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම අරහයා රාජධානිය හා එක්ව නායකත්වය සපයයි.

(ප්‍රධාන සේවා ඒකක වලට අනුයුක්තව රාජධානිය සමග කටයුතු කරන සීමිත පිරිසක් අගසෙති නායකයන් ලෙස ක්‍රියා කරනු ඇත.)

# ප්‍රධාන සේවා ඒකක

**1. සාමාජික බඳවා ගැනීම් සහ ප්‍රජා ගොඩනැගීම**

❖ අගසෙති වායාම වර්ධනයේ මූලික ශක්තිය ජනතාවය.

එබැවින් අගසෙති නායකයන්:

- නව සාමාජිකයන් බඳවා ගත යුතුය.
- රාජධානි ගිණුම් විවෘත කිරීමට සහාය විය යුතුය.
- පාසල් සිසුන්, විශ්වවිද්‍යාල සිසුන්, ගුරුවරුන්, සංචාරක මාර්ගෝපදේශකයන්, පුරාවිද්‍යා ලෝලීන් සහ ප්‍රදේශවාසීන් සම්බන්ධ කළ යුතුය.
- තනි තනි පුරාවිද්‍යා ස්ථාන වලට ආවේණික අගසෙති කණ්ඩායම් ගොඩනැගීමට නායකත්වය සැපයීම.

(සෑම නව සාමාජිකයෙකුම උරුම සංරක්ෂණයේ හවුල්කරුවෙකු ලෙස සලකනු ලැබේ.)

## 2. අධ්‍යාපනික සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

❖ උරුමය සුරැකීම ආරම්භ වන්නේ දැනුවත්භාවයෙන්ය.

පහත වැඩසටහන් සංවිධානය කිරීමේ දී අගසෙති නායකයන්ගේ සහයෝගය රාජධානිය විසින් ලබා ගනු ඇත.

- උරුම ඇවිදින සංචාර
- දේශන ,සාකච්ඡා, සම්මන්ත්‍රණ හා වැඩමුළු
- පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන්
- ඡායාරූප ප්‍රදර්ශන
- පුරාවිද්‍යා ස්ථාන සංචාර
- ප්‍රාදේශීය ඉතිහාස කතාබහ
- පුරා විද්‍යාඥයන්, ඉතිහාසඥයන් හා අගසෙති ප්‍රජාව අතර සම්බන්ධීකරණය තුලින් මහජනතාව දැනුවත් කිරීම.

## 3. අගසෙති වායාම අරමුදල

- පුරාවිද්‍යා සංරක්ෂණ කටයුතු සහ ගවේෂණ කටයුතු සදහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට සහ විශ්ව විද්‍යාලීය විද්වත් කණ්ඩායම් වලට අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සදහා අරමුදල් සම්පාදනය කිරීමට රාජධානිය විසින් උත්සහ කරනු ඇත. එවැනි අවස්ථා වලදී ලැබෙන අරමුදල් පරිපාලන කටයුතු විනිවිදභාවයකින් අධීක්ෂණය කිරීමට අගසෙති නායකයන්ගේ සහභාගීත්වය සහ සහයෝගය අපේක්ෂා කරනු ලැබේ.

## 4. උරුම සිතියම්ගත කිරීම සහ ලේඛනගත කිරීම

❖ මෙය අගසෙත් වායාම ප්‍රධානතම වගකීමකි.

අගසෙත් නායකයන්, දිවයින පුරා සිටින සියළුම අගසෙත් කණ්ඩායම් සම්බන්ධීකරණය කරමින් :

- පුරාවිද්‍යා ස්ථාන/පැරණි වැව්/පැරණි මාර්ග/ගල් පාලම්/ගල් ලිපි
- ආරාම/දේවාල/කෝවිල් /ජනශ්‍රැති හා දේශීය ඉතිහාසය

හඳුනාගෙන රාජධානි දත්ත පද්ධතියට ඇතුළත් කර කටයුතු කළ යුතුය.

එම දත්ත සමඟ:

- GPS ස්ථානගත කිරීම/ඡායාරූප/වීඩියෝ/විස්තර/ප්‍රදේශවාසීන්ගේ සාක්ෂි/පවතින අවදානම් වාර්තා විය යුතුය.

අපගේ දිගුකාලීන ඉලක්කය වන්නේ ශ්‍රී ලංකාවේ විශාලතම ජනතා උරුම සිතියම නිර්මාණය කිරීමයි.

# නායකත්වයේ මූලික වටිනාකම්

❖ අපි පහත වටිනාකම් මත ක්‍රියා කරමු.

<u>උරුමයට ගරු කිරීම</u>

- අප සුරකින්නේ ගල් සහ ගොඩනැගිලි පමණක් නොව, පරම්පරා ගණනාවක මතකයන්ය.

<u>සත්‍යවාදීභාවය</u>

- වාර්තා කරන සෑම තොරතුරක්ම හැකි තරම් නිවැරදි විය යුතුය.

<u>දේශපාලනික ස්වාධීනත්වය</u>

- අගසෙති වායාම කිසිදු දේශපාලනික කණ්ඩායමක මෙවලමක් නොවේ.

<u>ජනතා සහභාගීත්වය</u>

- උරුමය සුරැකීමේ අයිතිය සහ වගකීම සෑම කෙනෙකුටම ඇත.

<u>පරම්පරා අතර සම්බන්ධතාවය</u>

- අපගේ කාර්යය අතීතය සහ අනාගතය සම්බන්ධ කිරීමයි.

# අගසෙති සහ රාජධානි

❖ අගසෙති  වායාම රාජධානි ජාලයේ උරුම සහ සංස්කෘතික අංශය ලෙස ක්‍රියා කරයි. එමඟින්:

- නව පරිශීලකයන් රාජධානි වෙත සම්බන්ධ කිරීම
- උරුම දත්ත ගබඩාවක් නිර්මාණය කිරීම
- අගසෙති නායකයන් බිහිකිරීම
- පර්යේෂකයන් සහ ජනතාව සම්බන්ධ කිරීම
- සංරක්ෂණ ව්‍යාපෘති සඳහා සහයෝගීතාව ගොඩනැගීම සිදු කෙරේ.

Rajadhani
The Cradle of a New Civilization

# පසු සටහන

අපට උරුම වූ දේ සුරැකීම යනු අතීතයට ගරු කිරීමක් පමණක් නොවේ.

එය අපගේ දරුවන්ට සහ මුණුබුරන්ට අප දෙන පොරොන්දුවකි.

අගසෙති ව්‍යායාම එම පොරොන්දුව ඉටු කිරීම සඳහා එකතු වන ජනතා ව්‍යාපාරයකි.

අපගේ අරමුණ හුදෙක් පැරණි ස්ථාන සොයා ගැනීම නොව, ශ්‍රී ලංකාවේ මතකය, අනන්‍යතාවය සහ උරුමය අනාගතයට රැගෙන යාමයි.

**අගසෙති ව්‍යායාම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබ සියළු දෙනා මේ සඳහා විශේෂයෙන් නිර්මාණය කළ රාජධානි ජාලයට එක් වීමට කටයුතු කරන්න.**